සිංහලයාගේ ජාතික දුර්වලකම් නැති කර ධෛර්යමත් කර පෙරට යෑවීමත් එතුමන් විසින් සිදු කරන ලද වැදගත් කාර්යයක් විය.

මේ සියල්ලට වඩා මෙතුමන් විසින් දැඩි උද්වේගයෙන් ජාතික කැක්කුමකින් යුතුව වේගවත් වාග් මාලාවක් යොදා ගනිමින් සිංහලයා නැගී සිටුවීමටත්, ඉංග්‍රීසින් මෙල්ල කිරීමටත්, ගෙන ගිය ක්‍රියා කලාපය ඉතා වැදගත් වේ. ලසිංහලයිනි නැගිටිව්,



බුද්ධගයාව බේරා ගනිව්, කම්මැලියා ගොන් අලියා මෙන් අලසව නිදා නොගනිව්, වල් මීහරකුන් මෙන් නැම් පනා නොගසව්, ඉංග්‍රීසි නම් වෙනුවට සිංහල නම් ගනිව්, සෑප්පුව කෙළින් සිට ගනිව්, පරංගියාගේ සාය වෙනුවට ඔසරිය ඇඳ ගත යුතුයි. සුද්දට භය නම් නුඹලා සුද්දා වගේ පඹයෙක් හදා පඹයාට ගහපියව්....ල ආදි වශයෙන් මෙතුමා සෙන්පතියකු මෙන් එදා වැටී සිටි සිංහල ජාතියට සංස්කෘතික නියෝග නිකුත් කරන්නට විය.
මෙයින් කිපුණු මෙරට ආත්මාර්ථකාමී බලලෝභීන් අනගාරික ධර්මපාල තුමාට පවා අපහාස කරමින් එතුමා කලකිරවන්නට විය. ඔවුන් කීවේ මෙතුමා පිටරටවල්වල සවාරි ගහන්නේ දොන් කරෝලිස් සමාගමේ වෙළෙඳ ප්‍රචාරය සඳහා බවය. එහෙත් භාරතය, එංගලන්තය, ජර්මනිය, ජපානය, ඇමරිකාව, හොනොලූලූ ආදී රටවල එතුමා විසින් කරන ලද ආගමික කටයුතු අද වුවද දැක ගත හැකිය. 1928 දී එතුමා පෝස්ටර් මැතිණියගෙන් බෞද්ධාගමට ලබා ගත් මුදල රු. 3,91,032/* ක් විය. ඊට රු. 86 දාහක පොලියක් ද ලැබිණි. දොන් කරෝලිස් සමාගමේ දේපළ වලින් ද ලැබුණු 1/5 ක් වූ එතුමාගේ කොටස ද එක් කොට එතුමාගේ නමින් භාරකාර අරමුදලක් පිහිටුවා ඇත. මෙතරම් පරිත්‍යාග කළ මුළු ජීවිතයේම කාලය, ශ්‍රමය, බලය, රටට, ජාතියට, ආගමට කැප කළ එතුමාට විදේශ රටවලින් ගරු බුහුමන් ලැබෙද්දී, තමන්ගේ මිනිසුන්ගෙන් අපහාස එල්ල වන විට එතුමා කලකිරී අවසානයේ මෙසේ ප්‍රකාශ කළේය.

"..... මෙවැනි අසත්පුරුෂයින් මැද්දේ මට ජීවත් වන්නට සිදුවූයේ මගේ පෙර කරුමයක් නිසා වන්නට ඇත. මින්පසු මේ රටේ උපදින්නට තබා මැරෙන්නටවත් මට අදහසක් නැත. මා මළ විට මගේ මළකඳවත් මේ රටේ අසත්පුරුෂයන්ට දකින්නට ලැබෙන්නේ නැත....... " මෙසේ කියා දඹදිව ගිය ධර්මපාලතුමා 1933 අප්‍රේල් 29 දා ඉසිපතනයේදී අපවත් වූහ. එතුමාගේ ශ්‍රී දේහය ගෙන ඒමට ගිය අයට ගෙන ආ හැකි වූයේ භෂ්මාවශේෂ පමණකි.

මේ අනුව බලන විට දැනට ද සිදුවෙමින් පවතින නූතන සිංහල ජාතියේ පරිහානියේ ආරම්භය, ධර්මපාලතුමාගේ අභාවය සිදුවූ කාලයේ පටන් ආරම්භ වූ බව පැහැදිලි වේ. මෙතුමා ශ්‍රී ලංකාවේ අවසන් වරට කී වාක්‍ය කිහිපය පදනම් කරගෙන කරනු ලබන විග්‍රහයකින් හා ඒ අනුව යොදනු ලබන පිළියම් වලින් පමණක් ශ්‍රී ලංකාවේ පරිහානිය වළක්වා ගත හැකි වනු ඇත.
කෙසේ නමුදු ශත වර්ෂ 25 ක් මුළුල්ලේ කගපත ලෙළවමින්, සේනා සංවිධාන කරවමින් පෙරට ගොස් රට, දැය, සමය රැක ගත් දුටු ගැමුණු. ගජබා, විජයබා, පැරකුම්බා, රාජසිංහ ආදී හෙළ රජ දරුවන් මෙන් මෑත කාලයේදී වාග් ප්‍රහාරයෙන්, දේශීය හා විදේශීය ජාතිද්‍රෝහී බෞද්ධ විරෝධී සතුරන් මෙල්ල කරමින් ඉදිරියට ගොස් හෙළ දැයට ජීවය ලබා දුන් ධර්මපාල ශ්‍රී නාමය ද කිසිදා සිංහල ජනතාවගේ සිත් සතන් වලින් ඉවත් නොවනු ඇත.




